**සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදල - 2017**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 වියාචනය කළ මතය

**සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදලේ 2017** දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වියාචනය කළ මතයක් පළකරනු ලැබේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂය සඳහා කොඩි මුද්‍රණය කිරිම වෙනුවෙන් රු. 3,242,125 ක් වැය කර තිබූ අතර එම වියදමෙන් අරමුදල විසින් දරා තිබූ රු. 1,923,909 ක මුදල පමණක් වියදම් ලෙස ගිණුම්ගත කර තිබූ අතර සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු. 1,318,215 ක මුදල ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම බිල්පත් නිරවුල් කිරිම මුදල් අංශය මගින් සිදු කර ඇති හෙයින් සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන පදනමේ ගිණුම් සඳහා ඇතුළත් නොවූ බව. | ගෙවිය යුතු වියදම් ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | 2016 හා 2017 වර්ෂ වෙනුවෙන් කොඩි මුද්‍රණ වියදම් වලට අදාලව ලැබියයුතු රු. 3,937,065 ක් වූ කොඩි ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | රු. 3,937,065 ක් වූ ආදායම අදාල වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත කිරිමට අපහසු වූ බව. | වර්ෂයට අදාල ආදායම් ගිණුම්ගත කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති රු. 3,875,106 ක් වූ මුදල් ශේෂය හා සමුච්චිත අරමුදල් ශේෂයේ නිවැරදිතාවය තහවුරු කර ගැනිම සඳහා කිසිදු සාක්ෂියක් විගණයට ඉදිරිපත් නොවීය. | කොඩි මුද්‍රණ වියදම් සඳහා වූ දායක මුදල් විධිමත් ලෙස කළමනාකරණය කර පවත්වා ගෙන යාම සඳහා වෙනම ගිණුමක් ආරම්භ කිරිම සුදුසු බව සමාජ සංවර්ධන පදනමේ ජාතික මෙහෙයුම් කමිටු රැස්වීමේ දී තීරණය කරන ලදි. ඒ අනුව 2016.11.01 දින ආරම්භ කරන ලද “දිවිනැගුම ජාතික සමාජ සංවර්ධන පදනම” නම් වූ ගිණුම සඳහා, පොදු තැන්පතු ගිණුමට බැර කර තිබූ රුපියල් 3,875,106.24 ක මුදලක් බැර කරන ලදි. | අරමුදල් ශේෂයේ නිවැරදිතාවය තහවුරු කරගැනීම සඳහා අවශ්‍යය සාක්ෂි විගණනයට ඉදිරිපත් කල යුතුය. |
| (ඈ) | කොඩි වැඩ සටහන වෙනුවෙන් හා රූපවාහිනී වැඩසටහන් වෙනුවෙන් දරන ලද රු 2,403,372 ක වියදම තහවුරු කෙරෙන බිල්පත් විගණනය සඳහා ඉදිරිපත් නොවීය. | අරමුදල ට අදාල වවුචර් ගොනුව විගණනය සඳහා ඉදිරිපත් කර ඇත. | වියදම තහවුරු කෙරෙන බිල්පත් විගණනය සඳහා ඉදිරිපත් කල යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. (i) මුදල් රෙගුලාසි 381(1) | 2017 වර්ෂයේ සිට බැංකු ජංගම ගිණුමක් පවත්වාගෙන ගොස් තිබුණ ද මෙම වාර්තාවේ දිනය දක්වාම ඒ සඳහා භාණ්ඩාගර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 2017 අංක 2 දරණ පනතින් සංශෝධිත 2013 අංක 01 දරණ දිවිනැගුම පනතේ 45 වගන්තිය අනුව ' අරමුදල (ගිණුම) පෙර පරිදිම පවත්වා ගෙන යන ලදි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.375,020 ක ඌණතාවයක් නිරීක්ෂණය විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂය තුළ රු. 3,242,125 ක් වැයකර කොඩි මුද්‍රණය සිදුකර තිබුණද 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 ප්‍රකාරව මෙම ප්‍රසම්පාදනයේ විනිවිදභාවය නීත්‍යානුකූලභාවය හා ආර්ථිකභාවය පිළිබඳ ප්‍රසම්පාදන ක්‍රමවේදය පරීක්ෂා කිරිම සඳහා කිසිදු ලියවිල්ලක් අරමුදල සතුව නොපැවතුණි. | අදාල කාර්යය සඳහා ප්‍රසම්පාදන කටයුතු මුදල් අංශය මඟින් සිදු කල බවත්, ප්‍රජාමූල අංශය සතුව එහි ලේඛණ කිසිවක් නොමැති බව. | දෙපාර්තමේන්තුව විසින් මෙම අරමුදල ප්‍රජාමූල අංශයට පවරා දීමේදී අදාල සියළු ලියකියවිලි ලබාගත යුතු අතර ඒවා විගණනයට ඉදිරිපත් කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදලේ ව්‍යවස්ථාව ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2023 මැයි 22 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. | 2023 වසරේ සිට නිශ්චිත කාල සීමාවන් තුළ අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමට සටහන් කර ගත් බව. | නිශ්චිත කාල සීමාවන් තුළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතුය. |